# රඟ මඬල

කලාභූෂණ ගත්කතුවර, සංගීතඥ ශ්‍රී ලංකා ගුවන් විදුලි සේවයේ විශිෂ්ඨ ශ්‍රේණියේ ගායන හා වාද්‍ය ශිල්පී
**ලයනල් ගුණතිලක ලියයි**



**ශ්‍රී ලංකාවේ ටවර් හොල් යුගයේ, එනම් වර්ෂ 1911 සිට සිංහල නූර්ති නාට්‍ය කලාව පෝෂණය කළ නාට්‍යකරුවන්, සංගීතඥයින් හා නළු නිළියන්ගේ අප්‍රකට අනගි තොරතුරු අන්තර්ගත ලිපි මාලාව**

## සංගීත ශාස්ත්‍රී ඇම්.ජී. පෙරේරා සූරීන්



අප කතාණායකයාණෝ වර්ෂ 1870 කිසියම් ජන්ම ලාභය ලබා තිබේ. එතුමන්ගේ දෙමව්පියන් කවුරුන්ද යන්න සොයා ගැනීම අති දුෂ්කරය. කොළඹ පිටකොටුවේ වෙස්ලි විදුහලින් ඉංග්‍රිසි අධ්‍යාපනයද, විද්‍යෝදය පිරිවෙනේ අතිපූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමිපාණන්ගේ හා බටුවන්තුඩාවේ ශ්‍රී දේවරක්ෂිත පඬිතුමාගේ සිංහල, හින්දි සංස්කෘත යනාදිය භාෂාවන් උගත් මෙතුමා පෙරදිග සම්භාව්‍ය සංගීතය පෝෂණය කිරීම සඳහා අමිල මෙහෙවරයන් රාශියක් කර තිබේ.

එකල පැවති නාඩගම් නූර්ති නාට්‍ය සංගීතයටත් ඉමහත් ඇල්මක් දැක්වූ මෙතුමා පෙරදිග සම්භාව්‍ය ශාස්ත්‍රීය සංගීතයේ අක්මුල් සොයන්නට අති මහත් පරිශ්‍රමයක් දැරීය. ඒ අනුව ප්‍රාථමික පෙරදිග සංගීතය හැදෑරීම පිණිස එකල ජනප්‍රිය සංගීතඥයෙකු වූ කොළඹ කොටහේනේ විසූ ඒ. ජෝර්ජ් පෙරේරා (බේබි මහරාජා) සංගීතඥයාගෙන් සංගීතයේ මූලධර්ම හැදෑරුවද, තවදුරටත් සංගීතයේ ගැඹුර සෙවීමට තිබුනේ බලවත් පිපාසයකි.

අප රට සංගීත ලෝලීන්ට මෙන්ම විද්‍යාර්ථීන්ටද සංගීතයේ ප්‍රභලත්වය මෙන්ම එහි ප්‍රභවය පිළිබඳ තතු වටහා ගැනීම වස් ඉහමත් වෙහෙසක් දරා ඇති බව යට සඳහන් කරනු ලබන කෘතීන්ගෙන් මනාව ස්වුධ වේ. මෙතුමන් විසින් නාට්‍ය ක්ෂේත්‍රයට යොමු කරන ලද සිට රචනාවන්ගෙන් යුත් නාට්‍යයන් පළමු මෙහිලා තබනු ලැබේ.

### නාට්‍ය ග්‍රන්ථ

19100 දී හැම්ලට්, 1913 රොමියෝ ජුලියට, එම වසරේම නිමියස් හෙවත් අන්ධ වූ ක්ලෝඩියා, 1914 ඔතැලෝ, ලූසියස් ප්ලේටුස්, 1915 ජුලියට් සීසර්, මෙම නාට්‍ය සියල්ලම රඟ දක්වා තිබෙන්නේ ප්‍රාචීන නාට්‍ය සභාව හා කොළඹ නාට්‍ය සංගමය යන නාට්‍ය සභා මගිනි. මෙම තාට්‍යයන් නැරඹූ ප්‍රේක්ෂකයෝ මෙතුමාණගේ සත්ක්‍රියාදාමයට විශෘල ජන ප්‍රසාදයක් ලත් බව පැරැන්නෝ පැවසූ අයුරු ලේඛකයාගේ මනසේ මැවී පෙනේ.

### සංගීත ග්‍රන්ථ

1910 දී ගීත ශික්ෂක ප්‍රථම භාගය, 1912 දී ගීත ශික්ෂක ද්විතීය භාගය, 1917 ගීත මධුව, 1929 දී සංගීත කල්පද්‍රැම, බාලාංශ ගීත, 1929 ශ්‍රී බාලා සංගීත මාලා, 1930 ශ්‍රී ගීත මංජරිය, ද්විතීය භාගය, 1983 දී ගාන විද්‍යාව ප්‍රථම භාගය, 1933 ගීත ශික්ෂක තෘතිය භාගය යන කෘතීන් ඒ අතර වේ.

පෙරදිග සංගීතය හෙවත් උත්තර භාරතීය රාගධාරී සංගීතය ශාස්ත්‍රීය භාවය මෙන්ම එම ස්වර සංකලනයන්ගේ කර්ණ රසායන ස්වර මාධූර්‍ය අධුනිකයන්ට මෙන්ම විද්‍යාර්ථීන්ටද වටහා දීම පිණිස ග්‍රන්ථ සම්පාදනයේදී මෙතුමන් අති විශාල හින්දි, කර්නාටක, සංස්කෘත ආදී භාෂාවන්ගෙන් යුක්ත ග්‍රන්ථ රාශියක් පරිශීලනට කර ඇති බව 1933 වර්ෂයේ මුද්‍රණය කරන ලද ගීත ශික්ෂක තෘතීයභාගය කෘතියේ ඉතාමත් ම සවිස්තරව කරුණු කාරනා දක්වා තිබීම අතිවිෂයාත්‍රිකාන්ත බවනම් නොකියා නොහැකිය.

එම කෘතියේ ප්‍රථම පරිච්ඡේදයෙන් සංගීත නාද ස්වර, ශ්‍රැති, ග්‍රාම මූර්ජනා සහ ගමක යන සියුම් කරුණුද ද්විතීය පරිච්ඡේදයෙන් වර්ණාලංකාර, තාන යන කරුණු වලින්ද තෘතීය පරිච්ඡේදයෙන් තාල සහ වාද්‍යාදී කරුණු වලින්ද චතුර්ත පර්ච්ඡේදයෙන් මූල ගීත සහ ඒ පිළිබඳ දක්වා ඇති සියුම් කරුණින්ද පංචම පරිච්ඡේදයෙන් රාග සහ ඒ ඒ රාගයෙන්ගේ රස භාවයන්ද ෂෂ්ඨ පරිච්ඡේදයෙන් ප්‍රකීර්ණ ගීත ආදියෙන්ද සමලංකෘතයි. තවද ගීත ප්‍රබන්ධනයට අවශ්‍ය උපදෙස් ලඝු ගරු අක්ෂරයන්ගේ ප්‍රභේද හා ඵලවිපාක ඝනදොස් යනාදිය පිළිබඳව අති අනර්ඝ කරුණු දක්වා තිබීම විශේෂයෙන්ම අගය කළ යුතුයි.

එපමණක් නොව සංගීත ප්‍රභේද ආදිය ගැන අතිශය දුර්ලභ කරුණු සවිස්තරාත්මකව සඳහන් කර තිබුනත ලිපිය දීර්ඝ වන බැවින්, සංක්ෂිප්ත වශයෙන් මෙහි දැක්වූ බව සඳහන් කරමි. බෞද්ධ ජාතක කතා, බයිබලයෙන්, කුරානයෙන් පමණක් නොව ජගත් ලොවේ පඬිවරුන්ගේ දර්ශනයන් තුළින්ද ප්‍රාචීනාචාර්‍යවරුන්ගේ ග්‍රන්ථ රාශියක්ම දැඩි පරිශ්‍රමයකින් හදාරා ඇති බව එම කෘතියේ ප්‍රස්ථාවනාවේ සඳහන් කරුණු වලින් මනාව විද්‍යාමාන වේ. මෙතුමන් පෙරදිග සංගීතය වර්ධනය කිරීම පිණිස කර තිබෙන අනගි ක්‍රියාදාමයන් සිහි කිරීම වස් 1960 දශකයේ සිට සෑම වසරකම අප්‍රේල් මස 13 වෙනි දින හෝ ඊට ආසන්න දිනක පැයක පමණ කාලයක් ශ්‍රී ලංකා ගුවන් විදුලි සේවය ඔස්සේ අනුස්මරණ වැඩසටහන් රාශියක් ප්‍රචාරය කරන ලදී. එම වැඩසටහන් නිශ්පාදනය කළේ නැසීගිය සංගීතඥ සෝමචන්ද්‍ර පට්ටිආරච්චි මහතා විසිනි. එතුමන්ගේ අභාවයෙන් පසු එවැනි වැඩසටහන් ප්‍රචාරය අහෝසි වීම ඉතා සංවේග ජනකය. ලබන කලාපයෙන් තවත් විද්වතෙකු හඳුනාගනිමු.
ලියන්නේ

කලාභූෂණ සංගීතඥ ගත්කතුවර ශ්‍රී ලංකා ගුවන් විදුලි සේවයේ විශිෂ්ඨ ශ්‍රේණියේ ගායන හා වාද්‍ය ශිල්පී
**ලයනල් ගුණතිලක.**


**FOR ALL YOUR TRANSLATIONS**
PROFESSIONAL TRANSLATOR
NAATI accredited (Level 3)

( ENGLISH SINHALESE)
Documents for immigration purposes

- BIRTH , MARRIAGE, DEATH
- EDUCATIONAL/ VOCATIONAL
- LEGAL and POLICE DOCUMENTS
- NATIONAL IDENTITY CARDS

CONTACT
**DR. PREMA KUDALIGAMA**
( BA, PGDE, M.A. Ph.D (Edu.)
NAATI Level 3 (Interpreting & Translating)

Tel:(03) 94671658 mob: 0458 60 60 66
Email: premaku@bigpond.com